PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2019.11.04

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ජනාධිපති නීතීඥ එන්.ජේ. අබේසේකර මහතා,
සාමාජික,
මහාචාර්ය එස්. රත්නජීවන් හූල් මහතා,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය

මහත්මයාණෙනි,

**විද්‍යුත් මාධ්‍ය ආයතන මැතිවරණ කොමිෂන් සභාවේ උපමාන දිගින් දිගටම නොසලකා හැරීම පාලනය කිරීම වෙනුවෙන් ප්‍රායෝගික වැඩපිළිවෙලක් සකසමු.**

මෙවර ජනාධිපතිවරණය ආරම්භයේ සිට මේ දක්වා අවස්ථා ගණනාවකදී ඔබතුමන් හා කොමිෂන් සභාව මාධ්‍ය වෙත උපමාන නිකුත් කරනු ලැබීය. එමෙන්ම මාධ්‍ය ආයතන ප්‍රධානීන්, කළමණාකරුවන් වරින් වර කැඳවා උපදෙස් ලබාදෙන ලදී. එහෙත් එම පිරිසෙන් සැලකිය යුතු කොටසක් ඔබගේ උපදෙස් පිළිගනු ලබන බවක් නොපෙනේ.

අවස්ථා ගණනාවකදී කොමිෂන් සභාවේ නියෝජිතයන්ට රාජ්‍ය මාධ්‍ය ආයතන වල වැඩසටහන් නැවැත්වීමට එම ආයතන වලට යාමට සිදුවිය. එහෙත් නැවතත් එම ආයතනද ඔබතුමගේ උපදෙස් පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු නොකරමින් පෙර පරිදිම කටයුතු කරන බවත් දක්නට තිබේ. පෞද්ගලික මාධ්‍ය ආයතන සමහරක්ද මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස්, උපමාන හෝ අවම සාදාචාරසීමාව හෝ නොසලකා කටයුතු කරන බවක් පෙනී යයි.

මාධ්‍ය ආයතන රාජ්‍ය වේවා පෞද්ගලික වේවා එකම තරඟකාරී බිමක කටයුතු කරන අතර මෙම ආයතන සියල්ල ජනතාවට හිමි සංඛ්‍යාත භාවිතා කරමින් තම විකාශන කටයුතු සිදුකරන බැවින් ඔවුන් ජනතාවට වගකිවයුතු වේ. ඒ අනුව ජනතාවගේ ප්‍රධානම අයිතියක් වන ඡන්ද අයිතිය ආරක්ෂා කර දීමට ජනතාව වෙනුවෙන් මැතිවරණයකදී එය මෙහෙය වීමේ වගකීම ජනතාව වෙනුවෙන් ඉටු කරන මැතිවරණ කොමිසමේ නියෝග හා උපදෙස් වලට වගකීමට මාධ්‍ය ආයතන බැඳී සිටී.

එමෙන්ම වගකිව යුතු මාධ්‍ය ආයතන වල වගකීම වන්නේද එක දේශපාලන කඳවුරක් වෙනුවෙන් පෙනී සිටීම නොව මාධ්‍ය තුලින් ජනතාවට නිවැරදි තොරතුරු ගෙනයාමවේ. එම වගකීම දිගින් දිගටම මාධ්‍ය ආයතන නොසලකා හරින්නේ නම් මැතිවරණ කොමිෂන් සභාව ලෙස ඔබ ඍජු ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

එබැවින් අප නිරීක්ෂණ සංවිධාන ලෙස ඔබ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ ඉදිරි දින 10 ක කාලය තුළ මාධ්‍ය ආයතන නිරීක්ෂණය කිරීමට විධිමත් කමිටුවක් පත්කරන ලෙසත් එම කමිටුවට කිසියම් නිර්ණායක සමුදායන් සකස් කර ලකුණු ලබාදීමේ වැඩපිළිවෙලක් සකස් කරන ලෙසත්ය. එමෙන්ම ඒ පිළිබඳව සියළු මාධ්‍ය ආයතන දැනුවත් කර ලකුණු ලබාදීම සැලකිල්ලට ගෙන අවම මට්ටමකින් හෝ මැතිවරණ කොමිසමේ උපදෙස් උපමාන නොසලකා හරින මාධ්‍ය ආයතන වෙත මැතිවරණ ප්‍රථිපල විකාශය කිරීමේ අවස්ථාව අත්හිටුවන ලෙසය. එමෙන්ම ඒ පිළිබඳව මාධ්‍ය ආයතන දැනුවත් කරන ලෙසය.

එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීම මාධ්‍ය ආයතන වලට ඇති නිදහස සීමාකිරීමක් නොවන අතර ඔවුන් මැතිවරණ කාලය තුල කිසියම් ආචාරධර්ම පද්ධතියක් යටතේ සාධාරණව ක්‍රියාකිරීමට පෙළඹවීමක් ඇති කරන්නකි. එමෙන්ම එය ජනතාවගේ සංඛ්‍යාත අයිතියට ගරුකිරීමක්ද වේ.

මේ නිශ්චිත මොහොතේ ඇති සීමිත කාලසීමාව සැලකිල්ලට ගනිමින් යම් අතරමැදි විසඳුමකට යා යුතු නමුත් ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයේ සිට හෝ මෙම තත්වය පාලනය කිරීම වෙනුවෙන් යම් නෛතික රාමුවක් සකසා ගැනීමේ ක්‍රියාවලියකට යා යුතුයැයි යෝජනා කර සිටිමු.

එමෙන්ම මෙම තත්වය පිළිබඳව මාධ්‍ය ආයතන ප්‍රධානීන් අවබෝධයක් සහිත අය වන බැවින් ඔබතුමාගේ එවැනි තීන්දුවකට අනුගත වනු ඇතැයි විශ්වාස කරන අතර එසේ කරන ලෙසද අපද මාධ්‍ය ආයතන වලට ආයාචනා කරන්නෙමු.

මෙයට,
විශ්වාසී,



රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක